# ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් සහ භික්ෂු අධ්‍යාපනය.

## රාජකීය පණ්ඩිත කඩවත්ගම පියරතන හිමි.

වර්තමාන භික්ෂු අධ්‍යාපනයේ සහ ශාසනික උදාවේ සංඝරාජ මාහිමියන් ගේ උතුම් නාමය තරම් ගෞරවයෙන් සිහිපත් කළ හැකි වෙනත් නාමයක් නැති තරම් ය. උන්වහන්සේ ලංකා භික්ෂු ශාසනයත් සම්බුද්ධ ශාසනයත් සීඝ්‍රයෙන් පිරිහීගෙන ගිය යුගයක එය නගා සිටු වීම සඳහා විශාල මෙහෙයක යෙදුනහ. ලංකා බුද්ධ ශාසනයට අවශ්‍ය ම යුගයක එනම්, දහඅටවෙනි ශත වර්ෂයේ ලක්දිව උපන් මේ අද්විතීය උත්තමයා විසින් කරන ලද උතුම් ශාසනික සත් ක්‍රියාවන් සහ භික්ෂු අධ්‍යාපනය නගාසිටුවීමට ගත් මෙහෙය පිළිබඳ ඇගයීමක් කිරීම මෙම ලිපියෙහි අරමුණු වී තිබෙයි.

බෞද්ධ අධ්‍යාපනයෙහි ආරම්භය සිදු වූයේ බුදුරජාණන් වහන්සේ පස්වග මහණුන්ට දම්සක්පැවතුම් සූත්‍රය දේශනා කිරීමත් සමගයි. ලක්දිව මිහිඳුමහරහතන් වහන්සේගේ ආගමනයත් සමග භික්ෂු අධ්‍යාපනය ආරම්භ විය. මිහිඳු හිමියන්ගේ පැමිනීමටත් පළමු ව විජයාවතරණයේ සිට දෙවන පෑතිස් යුගය දක්වා සකස් වූ අධ්‍යාපනය ක්‍රමයක් ශ්‍රී ලංකාවේ දකින්නට ලැබෙයි. මේ සඳහා වංශකථා වලින් සාධක රාශියක් සොයාගත හැකි ය. එකල බමුණන් රජවරුන්ට පෙරවි කම් කළ බව වංශකථා කියයි.[1] පණ්ඩුල නම් බ්‍රාහ්මණයෙක් පණ්ඩුකාභය කුමාරයාට ඉගැන් වූ බව මහාවංශය ප්‍රකාශ කරයි.[2] පැරණි යුගයේ අධ්‍යාපනය හැදෑරූ විද්‍යාස්ථාන සොත්ථිශාලා යන නමින් දකින්නට ලැබෙයි. මේවා මුල් යුගයේ වෛද්‍ය ග්‍රන්ථ හැදෑරීම සඳහා යොදාගෙන ඇති බව පෙනෙයි.[3] පසුකාලීන ව මෙම වචනයෙන් ව්‍යවහාර වූ තැන් රෝහල යන ස්ථානය සඳහා භාවිත කර ඇති බව ගම්‍ය කරගත හැකි ය.[4] කෙසේ වෙතත් මිහිඳු යුගයට පෙර ද ලක්දිව අධ්‍යාපනයක් තිබුණු බව මෙම සාධක වලින් පැහැදිලි වෙයි.



පැරණි අධ්‍යාපනය බෙහෙවින් ශ්‍රැතිගෝචර වූවක් විය. එනිසා ම එකළ උගතුන්ට 'බහුශ්‍රැත' යන පදය ව්‍යවහාර වී තිබෙයි.[5] තවද භික්ෂු අධ්‍යාපනයෙදී කටපාඩමට ලැබී ඇත්තේ මුල්තැනකි. ත්‍රිපිටකය කටපාඩමින් ගෙනා භික්ෂූන් වහන්සේලා එකළ විරල නොවූහ. එමනිසා ම උන්වහන්සේලා දීඝභාණක මජ්ඣිම භාණක යනුවෙන් පරම්පරා වළින් හැඳින් වූහ.[6] ඉන්දියාවේදීත් ලංකාවේදීත් බෞද්ධ අධ්‍යාපනයේ ව්‍යාප්තිය සිදුවී තිබෙන්නේ ආරාම මුල් කරගෙනයි[7]. නමුත් ඉන්දියාවේ පසුකාලීන බෞද්ධ අධ්‍යාපනය මෙයට වඩා වෙනස් මුහුණුවරක් ගෙන තිබෙයි. එනම් විද්‍යාස්ථානවල දියුණුවයි. බෞද්ධ අධ්‍යාපනය සීමා වූයේ භික්ෂුවට පමණක් නොව, ගිහියන්ට ද එය විවෘතව තිබිණි. ගිහියන්ට අධ්‍යාපනය දීමත්, යහ මඟ යැවීමත් භික්ෂූන් කෙරෙහි පැවරෙන කාර්ය භාරයක් බව සිඟාලක සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙයි.[8] අතීතයේ සිටි භික්ෂූන් වහන්සේලා අධ්‍යාපනය මුලුමනින් ම තමාගේ අතට ගෙන ඉහත කී කාර්ය භාරය මැනවින් ඉටු කළහ.[9] එකල මුළුමනින් ම අධ්‍යාපනය සකස් වී තිබුනේ සදාචාර පද්ධතියක් උඩයි.[10] සදාචාරයෙන් තොර උගතා බෙහෙවින් පිළිකුල් කොට තිබෙයි. මුල් යුගයේ අධ්‍යාපනය ආගමික අධ්‍යාපනයක් ම විය[11]. එම හේතුව නිසා ඉහත තත්වය උදාවී තිබේ. මහින්දාගමනයෙන් පසු මුල් යුගයේ මෙරට පැවති අධ්‍යාපනය පිළිබඳ මහාචාර්ය මංගල ඉලංගසිංහ මෙවැනි ප්‍රකාශයක් කරයි. "ප්‍රතිපත්ති පූර්ණය, ශ්‍රැතිය ධාරණය භික්ෂු අධ්‍යාපනයේ පදනම විය. නිදහසේ ධර්ම විනය පිළිබඳ සාකච්ඡා පැවැත්වීම හා තමාගේ උගත්කම ගැන නිහතමානී වීම භික්ෂු අධ්‍යාපනය හැඩ ගැස්වූ එමෙන් ම එම අධ්‍යාපනයෙන් ඉස්මතුකර පෙන් වූ ලක්ෂණය විය.[12] මෙයින් ප්‍රකට වන්නේ සදාචාර භර පද්ධතියක් ඔස්සේ වර්ධනය වූ අධ්‍යාපනයක් මුල් යුගයේ ලක්දිව පැවති බවයි.

ශ්‍රී ලංකාවේ ථේරවාද භික්ෂු අධ්‍යාපනයේ මූලාරම්භය ඇති වී තිබෙන්නේ අනුරාධපුර මහමෙවුනා භූමිය තුළ පිහිටි මහාවිහාරයෙන් බව ප්‍රකට ය. පසුකාලීන ව රටේ නොයෙකුත් තැන්වල ඇති වූ කුඩා කුඩා අධ්‍යාපන ආයතන පිරිවෙන් යන නමින් ව්‍යවහාරයට පත් විය. මෙහිලා පරිවේණ යන්නෙන් හැඳින්වෙන්නේ කුමක් දැයි සොයා බැලිය යුතු ය. මුලින්ම මේ

වචනය පිළිබඳ ඇති විනය ටීකාව පිළිබඳ විමසා බලමු. එහි සඳහන් වෙන ආකාරයට මුලින් ම මහා විහාරයේ ප්‍රාකාරයෙන් වට කරන ලද ඒ ඒ තැන් වල පිහිටි කුටි පිරිවෙන නමින් හඳුන්වා ඇත.[13] තවද කොටහේනේ පඤ්ඤාකිත්ති හිමියන්ට අනුව[14] අසන පිරුවහන තැන පිරුවන වශයෙන් සඳහන් කර තිබෙයි. උන්වහන්සේ ද මෙම අදහස ගෙන ඇත්තේ විමති විනෝදනී විනය ටීකාවෙන් ම ය.[15] පිරුවන එදා සිට මේ දක්වා ම ශ්‍රී ලංකාවේ භික්ෂු අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානය විය. බෞද්ධ අධ්‍යාපනයෙහි පරමාර්ථය නිර්වාණාවබෝධයයි.[16] ඒ සඳහා ස්ත්‍රී-පුරුෂ භේදයක් නොමැතිව සෑම පුද්ගලයාට ම ධර්මය අවබෝධ කරගැනීමට අවස්ථාව ලබාදී තිබෙයි. එය බෞද්ධ අධ්‍යාපනය සම්බන්ධයෙන් බුදුරජාණන් වහන්සේගේ පැහැදිලි ප්‍රතිපත්තියයි.[17] මේ සඳහා මුලුමහත් සමාජය ම කොටස් හතරකට බෙදා නිර්වාණය නැමති අරමුණ කරා යොමු කරවා ගෙන තිබෙයි. එම කොටස් හතර නම් භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා නමින් හැඳින්වෙයි. ශ්‍රී ලංකාවේ ද මුල් යුගයේ අධ්‍යාපන සම්ප්‍රදායේ පරමාර්ථය වූයේ ද සදාචාර පාරප්‍රාප්තිය වූ නිර්වාණාව බෝධය ලබා ගැනීමයි.

පසු කාලීන ව වෙනස් වන සමාජයත් සමග විවිධ මිනිස් අවශ්‍යතාවයන් ඔස්සේ හැඩ ගැසුණු අධ්‍යාපනයක් දකින්නට ලැබෙයි. එම නිසා භික්ෂු අධ්‍යාපනය ද ලෞකික විෂයයන් හා මිශ්‍රව පැවති බව පෙනෙයි. ඒ බව පොළොන්නරු දඹදෙණි කතිකාවත් ආදී තැන් වලින් මැනවින් පෙනෙයි.[18] මේ ආකාරයට උතුම් පරමාර්ථ සාධනය කරගැනීම සඳහා යොදාගත් භික්ෂු අධ්‍යාපනය ක්‍රමයෙන් ශ්‍රී ලංකාව තුළ පිරිහෙන්නට පටන් ගත්තේ ය.[19] නමුත් තරමක හෝ සාහිත්‍ය උන්නතියක් කෝට්ටේ යුගයේ දී දැක ගත හැකි ය. එයද ගද්‍යයට වඩා පද්‍යයට ලැදිකමක් දක්වා ඇත.[20] එම සාහිත්‍ය යුගයද එතරම් දුරට නො පැවතුනේ ය. දහසය වන සියවස පටන් ශතවර්ෂ කිහිපයක් පෘතුගීසි ලන්දේසි සහ ඉංග්‍රීසි ආක්‍රමණ වලින් මෙරට අධ්‍යාපනය මුළුමනින් ම පිරිහෙන්නට පටන් ගත්තේ ය. නායක්කාර් වංශිකයන් රාජ්‍ය විචාරීම ද මේ සඳහා තවත් හේතුවක් විය.[21] එම



නිසා නුවර යුගය භාෂා ශබ්ද ශාස්ත්‍රාදියේ පරිහානිකර යුගය විය.[22] එකල භික්ෂුව නමින් පෙනී සිටි අය ආරාම සතු දේපල ද පෞද්ගලික බූදලයක් කරගත් හ. ශාසනයේ සහ අධ්‍යාපනයේ පරිහානිකර ම යුගයක් ලෙස නුවර යුගයේ මුල්කාලය පෙන්වා දිය හැකි ය. සරණංකර හිමියන්ගේ පහළ වීම සිදු වූයේ ද මෙම යුගයේ දී ය. උන්වහන්සේගේ නායකත්වයෙන් මුළුමහත් ශ්‍රී ලංකාව පුරාම නැවතත් භික්ෂු අධ්‍යාපනයේ සහ ශාසනයේ පුනරුදයක් දැකගත හැකි විය.[23]

සරණංකර සංඝරාජ මා හිමියන් උපත ලැබුවේ තුම්පනේ වැලිවිට නැමති කුඩා ග්‍රාමයේ දී ය. එනම් ක්‍රි:ව: 1698 ජුනි මස 19 වෙනි දිනයි. උන්වහන්සේගේ පියා කුලතුංග නම් මුදලි තුමායි. කුඩා කුමරුට කුලතුංගබණ්ඩා යන නම දෙමාපියන් විසින් ම තබන ලදී.[24] වීර පරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජු සෙංකඩගල නුවර රජ කරන සමයෙහි සොළොස් හැවිරිදි කුලතුංගබණ්ඩා සූරියගොඩ විහාරයේ දී සූරිය ගොඩ සාමණේර තැන ළඟ සරණංකර යන නමින් පැවිදි බව ලැබූහ.[25] එකල පන්සල්වල සිවුරු පොරවාගෙන සිටි අයගේ පිළිවෙත් පිරීමක් හෝ පිණ්ඩපාතයේ යාමක් හෝ වෙනත් ශාසනික කටයුතුත් දකින්නට නො ලැබුනේ ය. තත් කාලීන භික්ෂුන් වහන්සේලා කාන්තාවන් ගෙන්වාගෙන පිස කමින් කල් ගත කළ නිසා ගනින්නාන්සේලා යන නමින් ප්‍රසිද්ධියට පත් වූහ.[26] සරණංකර සාමණේරයන් වහන්සේ ගිහි කාලයේ දී ම කටුක දිවියට හුරු පුරුදු වී සිටියේ ය. කුඩා කාලයේ ම එරමුදුලියද්දේ උපාසක රාළ ලවා සිංහල භාෂාව සහ සාහිත්‍ය පිළිබඳව මනා දැනුමක් උන්වහන්සේ ලබා ගත්හ. එතුමාගෙන් සිංහල හෝඩිය, වැල්ලේ ලිවීම, නම්පොත, මහුල් ලකුණ, සකස්කඩ, ව්‍යාසකාරය ආදී ශතක පොත් ද උගෙන ගත්තේ ය.[27] එම කාලයේ දී ම මුද්දරදෙණියේ හේරත් ගෙදර ගුරුතුමාගෙන් වඩවඩාත් අධ්‍යාපන දැනුම දියුණු කරගත්තේ ය.[28] සරණංකර කුඩා සාමණේර හාමුදුරුවන්ගේ ළමා කාලය තුළම දැක ගත හැකි වන්නේ අප්‍රතිහත ධෛර්යයෙන් යුක්ත ව කටයුතු කළ ආකාරයයි. එසේ ම කෙසේ හෝ තමා බුද්ධශාසනය බේරාගත යුතු ය යන අදහස ද කුඩා කළ සිට ම තිබුණු බව

පෙනෙයි. බාලාවතාරයේ සමාස කාණ්ඩයේ පටන් අවසානය දක්වා පල්කුඹුරේ අත්ථදස්සී හිමියන්ගෙන් ද[29] බාලාවතාරයේ මුල් කාණ්ඩය හෙවත් නාම කාණ්ඩයේ අවසානය දක්වා මාකෙහෙල්වල හිර කුඩුවේ සිටි ලෙව්කේ රාලගෙන්[30] ද ඉගෙන ගත්තේ ය. සරණංකර හිමියෝ සිල්වත් සමාගම නමින් අලුත් ම සදාචාරමත් පිරිසක් තැනූහ. මෙම සිල්වත් සමාගමේ පැවිදි වීමට කිසිවෙකුගේ කුලභේදාදිය ගනනකට නොගත්තේ ය. පිළිවෙත් පිරීම සහ පරාර්ථ චර්යාව ම පමණක් ඉතාමත් උසස් කොට සැලකූහ.[31] උන්වහන්සේ විසින් ආරම්භ කරන ලද සිල්වත් සමාගමේ ගිහි පැවිදි විශාල පිරිසක් ශබ්ද ශාස්ත්‍රාදිය උගත්හ.[32] සිල්වත් සමාගමේ බොහෝ දෙනා උපාසක වරුන් ගෙන්වාගෙන නොයෙකුත් බණ දහම් ආදිය කියා දෙමින් ශාසන මාමක ගිහි පිරිසක් තැනීමට මහන්සි ගත්හ.[33] සරණංකර හිමියන් මෙතෙක් මිනිසුන්ට අමතක වී තිබුණු පිණ්ඩපාතිකාංගය නැවතත් ඇති කිරීමට මහත් වෙහෙසක් ගත්තේ ය. තවද අභාවයට ගිය පාංශුකූලිකාංගය සපදාන චාරිකාංගය, පත්ත පිණ්ඩිකාංගය, ඒකාසනිකාංගය ආරණ්‍යකාංගය යන ධුතාංග සිල්වත් අයට ඉගැන්වූහ.[34] පිරිහීගිය බුද්ධ ශාසනයත් ශාස්ත්‍ර ඥානයත් නැවත උදාකර ලීමට සංඝරාජ මාහිමියන් ගෙන ඇති අප්‍රතිහත ධෛර්යය හා ආත්ම පරිත්‍යාගය අති මහත් ය. අස්ගිරිය මල්වත්ත යන විහාර දෙකේම සිටින සාමණේර උන්නාන්සේලා නරක යැයි කියා වැදීමක්වත් දන් පිදීමක්වත් එකළ නො කළේ ය.[35] එම නිසා පළමු කොට ම උන්වහන්සේ පිළිවෙත් පුරා පසුව අන් අයට ඒවා ටිකෙන් ටික ඉගැන්වීමට කටයුතු කළහ.[36] එම නිසා මල්වතු අස්ගිරි යන උභය විහාරවලින් උන්වහන්සේට නොයකුත් කරදර බාදක එල්ල විය. උන්වහන්සේලා වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාට නෙයෙකුත් ගතු කේලම් කියා සාමණේරයන් වහන්සේ කෙරෙහි රජ කෝප කළ හ. තවද උන් වහන්සේ, රජ මාලිගයට ඉන්දියාවෙන් පැමිණි බ්‍රාහ්මණයෙකුට සංස්කෘත භාෂාවෙන් ධර්ම දේශනා කළහ. අනතුරුව පාලි භාෂාවෙන් ද ධර්මදේශනා කළහ. මේ තුළින් උන්වහන්සේගේ භාෂා ඥානයත් පිළිබඳව පැහැදිලි වෙයි.[37] මෙම කාලය තුළ වැලිවිට සිල්වත් සමාගමේ අය ගමින් ගමට යමින් ගිහි අයට අකුරු වැල්ලේ ලියා ක්‍රමයෙන් ශබ්ද ශාස්ත්‍ර උගන්වා රටපුරා ශාස්ත්‍රීය දියුණුවක් ඇති කිරීමට කටයුතු කළහ.[38] ඒ අතර ශ්‍රද්ධාවන්ත ලෝකවාසී බොහෝ සත්



පුරුෂයන්ට බණ දහම් කියමින් මහණ වීමට ඇදහිලි ඇති දන්නා නොදන්නා වයස් ඇති සත්පුරුෂයන් කසාවත් හඳවා දසසිල් දුන්හ.[39] වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා එතුමා ගැන අපමණ ප්‍රසාදයට පත් වී කුණ්ඩසාලේ අසලින් උන්වහන්සේට පන්සලක් කරවා පූජා කළේ ය. එසේ ම ලංකාතිලක විහාරය අසල නියම කන්ද පිරිවන කරවා පූජා කළේ ද එතුමායි. පසු කාලීන ව නියම කන්ද පිරිවන මුල්කරගෙන විශාල ශාස්ත්‍රීය සේවාවන් සිදු විය. පාලි ව්‍යාකරණ ග්‍රන්ථ මෙන්ම වංශකථා ග්‍රන්ථ ද ශතක පොත් පත් රාශියක්ද මෙහි කටපාඩම් කරවූවේ ය[40]. ඉහත සඳහන් කළ නියමකන්දේ පිරිවනට අමතර ව මල්වතු අස්ගිරි යන ප්‍රධාන විහාර දෙක අසල ද විද්‍යාස්ථානයක් කර වීය. ගඩලාදෙණිය සද්ධම්මතිලක විහාරස්ථානයේ ද උගත් තෙර කෙනෙකුන්ගේ මූලිකත්වයෙන් තවත් විද්‍යාස්ථාන යක් පිහිට වූහ. එයද උන්වහන්සේගේ ම මූලිකත්වයෙන් සිදුවිය.[41] ඇම්බැක්කේ දේවාලය අසලද විද්‍යාස්ථානයක් පිහිට වූ බවත්,[42] එයද අංග සම්පූර්ණ විද්‍යස්ථානයක් බවත් සඳහන් වෙයි. මෙම විද්‍යාස්ථාන කිහිපයේ දීම පිටරටවළින් ගෙන්වාගත් දුර්ලභ පොත පත සිංහලට පෙරලීම් ආදිය සිදුකර තිබේ. එසේ ම ඉතා වටිනා පුස්තකාල තිබුණු බවත් ධර්ම ග්‍රන්ථ ලියා ඒවායෙහි තැන්පත් කළ බවත් සඳහන්කර තිබෙයි. මේ ආකාරයට උන්වහන්සේලාගෙන් සිදුවූ ශාස්ත්‍රීය සේවාව අති මහත් ය. ඊසිපිටියේ සාමණේරයන් වහන්සේ කප්පාගොඩ, නාගොල්ලේ ආදී හිමිවරුන්ගේ මුලිකත්වයෙන් ශාසනික ප්‍රතිපදාවන් රට පුරා ව්‍යාප්ත කළ බව බෙහෙවින් පෙනීයන කරුණකි.[43] සරණංකර මාහිමියන්ගෙන් සිදුවූ තවත් විශාලතම සේවාවක් වූයේ නැතිවී ගිය උපසම්පදාව නැවත වරක් මෙරට ඇති කිරීමයි. එසේම ඒ තුළින් විනාශයට පත්වී ගිය ශාසනික ප්‍රතිපත්ති නැවත ඇති කිරීම ද උන්වහන්සේගේ අරමුණ විය. උන්වහන්සේ පළමු වරට ශ්‍රී විජය රාජසිංහ මහ රජතුමාත් සමඟ සාකච්ඡා කර බොහෝ පඬුරු පාක්කුඩම් සකස් කරවා සියමයට දූත පිරිස් යැවූහ. මේ සඳහා උන්වහනසේට ඉතා හිතවත් සාමණේර හිමිවරු කිහිපදෙනෙක් කසාවත් හරවා යොදාගත්හ. නමුත් නැව මූදු බත් වූයෙන් පළමුගමන අසාර්ථක විය.[44] එයින් ද පසුබට නොවූ සරණංකර හිමියෝ දෙවැනි ගමන ද සංවිධානය කළහ. එයද ශ්‍රී විජය රාජසිංහ රජතුමාගේම ප්‍රධානත්වයෙන් පිටත් කළහ. අතර මහදී රජතුමා මිය ගිය බව

දැන ගැනීමෙන් එම ගමන ද අසාර්ථක විය. අතර මගදී විල්බාගෙදර මුහන්දිරම් රාළ හැර අනෙක් සියළුම දෙනා නොයෙකුත් අන්තරාවන් වලට පැමිණ මියගියහ.[45] ඉන් පසු ශ්‍රී ලංකාවේ රජ බවට පත්වුයේ කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමායි. මෙතුමාගේ කාලය නුවර යුගයේ අතිශයින් වටිනා කාල පරිච්ඡේදය වශයෙන් සැලකිය හැකි ය. කුමක් නිසාද යත් එතුමාගෙන් සම්බුද්ධ ශාසනයට ඉටුවූ සේවය නිසයි. මාහිමියෝ මෙතෙක් ලන්දේසීන් ගෙන් පෘතුගීසීන්ගෙන් ලක්දිව බුදුසමයට පැමිණි සියලු උපද්‍රව රජතුමා සමග පැවසූහ. මෙය ඉතා ඉක්මනින් නැති කළ යුතු බවත් නැවත සසුනේ සහ ශබ්ද ශාස්ත්‍රාදියේ පුනරුදයක් ඇති කළ යුතු බවත් සියලු කාරණා පැහැදිලි කර දුන්නේ ය. සියල්ල තේරුම්ගත් මහරජතුමා පළමු ව අධ්‍යාපන ආයතන රාශියක් ආරම්භ කිරීමට අතහිත දුන්නේ ය. ඒ අතර අස්ගිරිය [46] සුදුහුම්පොල තිත්තවෙල ආදී ස්ථාන පෙන්වා දිය හැකි ය. උපසම්පදාව මෙරට නැවත පිහිටු වීමේ කාර්ය දෙවන වරටත් අසාර්ථක වීමෙන් උන්වහන්සේ අත් නොහැරියහ. කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමාට ද ඇති තතු පහදා දී උපසම්පදා කර්මය නැවත ගෙන ඒමෙන් මෙරට ශාසනය ස්ථාපිත කළ යුතු බවත් පැවසූහ. නැවතත් සරණංකර හිමියෝ තෙවන වරටත් මෙම රජතුමාගේ මූලිකත්වයෙන් සියමයට දූත පිරිස් යැවූහ. එම ගමනේ ප්‍රතිඵලයක් වශයෙන් නැවත අප රටේ උපසම්පදාව ඇති කිරීමට හැකි විය.[47] උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් විසිඑක් නමක් ලක්දිවට වැඩම කොට ක්‍රි.ව. 1746 ඇසල මස පුන් පොහෝ දින ලක්දිව උපසම්පදාව ඇති කොට වදාළහ. පළමුවෙන් ම ලාංකික හිමි නමක් හැටියට උපසම්පදාව කර වුයේ කොබ්බෑකඩුවේ සාමණේරයන් වහන්සේයි. එමගින් ද පෙන්නුම් කර ඇත්තේ සරණංකර සංඝරාජමාහිමියන්ගේ උතුම් නිහතමානිත්වයයි.[48]

සරණංකර සඟරජ මාහිමියන්ගේ පළමු වස්කාලය තුළ දීම සිය ගණන් භික්ෂූන් වහන්සේලා මල්වතු මහා විහාරයේ දී උපසම්පදා කර මුළු මහත් සම්බුද්ධ ශාසනයම බැබලවූහ.[49] තවද ලක්දිව බොහෝ තැන් වල සීමාමාලක බැඳ නැතිවී ගිය පොහොය කිරීම් ආදිය නැවත වරක් ආරම්භ කළහ.[50] උන්වහන්සේ තුළ තිබු විනය ගරුකත්වය සහ ථෙරවාදී සම්ප්‍රදාය ආරක්ෂා



කිරීමට විශාල මෙහෙයක් ගෙන තිබෙයි. තවද උන්වහන්සේ ධම්මිකාරාමය නමින් ආරාමයක් මල්වතු වෙහෙරෙහි උපසම්පදාව සඳහා වැඩමවන ලද මහාසංඝයා වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ඉදිකළහ. එය ඉදිකරන ලද්දේ කිත්සිරි[51] රජතුමාගේ මූලිකත්වයෙනි. උන්වහන්සේ ආරම්භකරන ලද උපසම්පදා පුණ්‍ය කර්මය වාර්ෂික ව සිදුකෙරෙන පුණ්‍ය කර්මයක් වශයෙන් මේ වන තුරාත් පවත්වාගෙන ඒ මට හැකි වී තිබේ.

සරණංකර මාහිමියන් විසින් සිදුකරන ලද ශාසනික මෙහෙයයන් පිළිබඳ ව එකළ සිටි සෑම රජකෙනෙකු පාහේම උන්වහන්සේ කෙරෙහි බෙහෙවින් පැහැදුණහ. උන්වහන්සේ වැඩසිටිනා තැන්වලට සොයාගෙන අවුත් නොයෙකුත් ශාසනික පදවි පිරිනැමූහ. වීදාගම මහාමෛත්‍රිය සංඝරාජ හිමියන්ගෙන් හිස්ව පැවති සංඝරාජ තනතුර වැලිවිට ශ්‍රී අසරණ සරණ සරණංකර හිමියන්ට පිරුනැමූහ.[52] එය සංකේතවත් කරමින් ඒ සඳහා අදාළ වටා පත එතුමා විසින් ම උන්වහන්සේට පිරිනමන ලදී. මෙම පදවියත් සමහම ලාංකේය භික්ෂූන් වහන්සේලාගේ නායකත්වය උන්වහන්සේ වෙත ලැබුණාහ.[53] ඒ සමගම සියලු භික්ෂූන් වහන්සේලා පාලනය කිරීමේ බලතල ද සියලු ආරවුල් විසඳීමේ අධිකරණ බලය ද උන්වහනසේ වෙත ලැබුනේ ය. එවැනි උත්තරීතර පදවියක් සංඝරාජ පදවිය.[54] සංඝරාජ පදවියට අමතර ව උන්වහන්සේට "රාජගුරු" යන නාමයෙන් පුදනු ලබා තිබෙයි.[55] එය පිරිනමා ඇත්තේ ශ්‍රී විජය රාජසිංහ රජතුමායි.[56] එතුමා රාජ්‍ය ලබාගැනීමෙන් පසු පළමුවෙන්ම කරන ලද කාර්ය භාරය වූයේ මෙයයි. එතුමා මෙම පදවිය උන්වහන්සේට පිරිනමා ඇත්තේ උන්වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාවට සහ එකල සිටි සියලු රජවරුන්ගේ මාර්ගෝපදේශකයා ද වූ නිසා ය.

සරණංකර සංඝරාජ මාහිමියන් ලක්දිව බොහෝ තැන් වල පිහිටි ජරාවාස වී ගිය නොයෙකුත් වෙහෙර විහාර කටු කොහොල් ඉවත් කරවා පිළිසකර කර ඒවායෙහි භික්ෂූන් වහන්සේලා නතර කරවූහ. බුද්ධපූජා තේවා ආදී කටයුතු නොපිරිහෙලා සිදු කිරීමට උන්වහන්සේලාට උපදෙස් දුන්හ. ශාසන උන්නතිය සඳහා උන්වහන්සේ විසින් මෙවැනි කටයුතු රාශියක් සිදුකළහ. වටපුලුව නම් ස්ථානයේ ඉතාමත් අලංකාර විහාරයක් කරවා එහි රන් ආලේපිත බුද්ධ ප්‍රතිමාවක් තැන්පත් කර වූහ.[57] සුදුහුම්පොල

විහාරය පිළිසකර කරවූයේ ද සංඝරාජ මාහිමියන්ගේ ම මූලිකත්වයෙනි.[58] කුණ්ඩසාලේ පන්සලේ චෛත්‍යයක් සාදවා වතාවත් කිරීම ආරම්භ කළහ.[59] අම්පිටිය විහාරය ද මහත්වූ කැප කිරීමකින් පිළිසකර කරවූහ.[60] උඩුවෙල ද මිනිසුන් එකතු කරවා අලුතෙන්ම විහාරයක් තැනවූහ.[61] රජතුමාගේ ප්‍රධාත්වයෙන් දළදා වහන්සේට දෙමහල් මන්දිරයක් තනවා පූජා කළේ ද සංඝරාජ මාහිමියන්ගේ අනුශාසකත්වය නිසා ම ය.[62] අනුරාධපුරයේ අටමස්ථානය ද බොහෝ තැන්වල කටු කොහොල් ඉවත් කරවා ඒවා පිළිසකර කරවූහ. ශ්‍රී මහා බෝධීන් වහන්සේ වටා ගල් බැම්මක් බන්දවා එය අලින්ගෙන් ආරක්‍ෂා කරගත්හ.[63] තවද ශ්‍රී පාදස්ථානයේ නොයෙකුත් පිළිසකර කටයුතු කළහ. ගල් පඩිපෙල බැඳ එය මාලිම්බඩ මහා ස්වාමීන්ට පවරා දිනපතා වත් පිළිවෙත් පිරීමට සැලැස්වූහ.[64] සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ කිසි කලෙකත් දියුණු විහාරස්ථානයක වස් නොවිසූහ. කැලැබ විහාරස්ථානයක වස් වැසූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් වස්කාලය නිමාවට පත් වීමත් සමග ම උන් වහන්සේ වැඩ සිටි ආරාමය සියලු විහාර අංග වලින් සමන්විත අංගසම්පූර්ණ විහාරයක් බවට පත් විය.[65] දඹුලු විහාරය, රිදීවිහාරය, දෙගල්දොරු ව යන ආදී පුරාණ ස්ථානද උන්වහන්සේගේ මූලිකත්වයෙන් පිළිසකර කළතැන්ය.[66] මෙම විහාරස්ථාන පිහිට ඇත්තේ සත් කෝරලය ප්‍රදේශයේ ය. මේ අනුව උන්වහන්සේගේ ආශීර්වාදය සත්කෝරලයට ද බෙහෙවින් බලපා තිබෙයි. රුහුණේ තිස්සවිහාරය ආදී කොට ඇති විහාර රාම රාශියක් මේ හිමියන් විසින් දියුණුවට පත්කළහ.[67] දළදා මාලිගාවේ බොහෝ කාලයක් තිස්සේ පැවතී ඇත්තේ සතර දේවලයන් හි පෙරහැර පමණි. නමුත් මුන්වහන්සේ එම පෙරහැරේ ප්‍රධාන අංගය ලෙසට දළදා පෙරහැර එයට එක් කිරීම ද සිදුකළහ.[68] මේ ආකාරයට ත්‍රි සිංහලයෙහි ම ශාසනය ප්‍රතිෂ්ඨාපනය කිරීමට උන්වහන්සේ කටයුතු කළහ. එපමණකින් ම නො නැවතුණු උන්වහන්සේ මිනිස්සුන්ගේ හදවත් වලට ධර්මය කාවැද්දීම සඳහා ධර්ම කථිකයන් වහන්සේලා පුහුණු කිරීමේ වැඩ සටහනක් ද ආරම්භ කළහ.[69] වර්තමානයෙහි ලක්දිව පවත්නාවූ භික්ෂු පරම්පරා පනහකට අධික ප්‍රමාණයක් වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් ආරම්භ වී විකාශනය වී තිබෙයි.[70] මෙලෙස උන්වහන්සේගේ ශාසනික සේවාව නිසා ලක්දිව සෑම



තැනකම බුදුදහමේ ආලෝකය මිනිස් හදවත් වලට දැනුන බව සඳහන් කළ හැකි ය. මෙසේ වර්තමාන සංඝසංස්ථාවේ දියුණුව සරණංකර මා හිමියන් කේන්ද්‍රකරගෙන පැවතුණු ආකාරය මෙයින් පැහැදිලි වෙයි.

සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ශාස්ත්‍රීය සේවාවන් තුළින් භික්ෂු අධ්‍යාපනයට නව ජීවයක් ලැබිණි. පාලිභාෂාව පිළිබඳ භික්ෂූන් දැනුවත් කිරීම සඳහා උන්වහන්සේ පාලි පොත් රාශියක් රචනා කළහ. ගුණාත්මක අංගයන්ගෙන් යුත් අහනා කෘති ගණනාවක් ම සිංහල භාෂාවෙන් රචනා කළහ. සරණංකර සංඝරාජයන් වහන්සේ ප්‍රාචීන භාෂා පිළිබඳ විශාරදයෙක් බව එතුමාගේ ග්‍රන්ථ පරිශීලනය කිරීමෙන් පෙනී යයි. පාලි - සංස්කෘත - සිංහල - ප්‍රාකෘත ආදී භාෂා හයක් පිළිබඳ මනා දැණුමක් තිබුණු බව පෙනෙයි.[71] කෝට්ටේ යුගයේ ජගත් කීර්තියට පත් තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමිපාණන් වහන්සේගෙන් පසුව ලක්දිව පහළ වූ අද්විතීය ධර්ම ශාස්ත්‍ර විශාරදයා ලෙස වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජයාණන් වහන්සේ පෙන්වා දිය හැකි ය. උන්වහන්සේගේ ග්‍රන්ථ වල වැඩි අවධානයක් යොමු කර ඇත්තේ භික්ෂු අධ්‍යාපනයේ ප්‍රවර්ධන සඳහා ය. පිරිහීගිය ශාසනික ප්‍රතිපත්තිවල අගය භික්ෂූන්ට වටහා දීම අනෙක් අරමුණ විය. මාහිමියන්ගේ ග්‍රන්ථ පිළිබඳ කෙටි හැඳින්වීමක් මෙහිදී සිදුකරනු ලැබෙයි.

සරණංකර සංඝරාජ මාහිමියන්ගේ පළමු ග්‍රන්ථය මුණි ගුණ අලංකාරයයි.[72] පාලිභාෂාවෙන් නොයෙකුත් වෘත්ත වලට අනුව පද්‍යය බන්ධනය පිළිබඳ උන්වහන්සේගේ දැනුම ප්‍රකාශවෙන කෘතියකි. බුදුරජාණන් වහන්සගේ බුදුගුණ වර්ණනා කිරීම මෙම ග්‍රන්ථයෙන් සිදුකර තිබෙයි. ශිෂ්‍යයන්හි එක් පැත්තකින් බුදුරජාණන් වහනසේ පිළිබඳ දැනගනියි. · අනික් අංශයෙන් රසවත් ලෙස පාලි භාෂාව භාවිත කිරීම සිදුකරයි. බුදුගුණ හොවා දැක්වීම මෙකල අනිවාර්යයෙන් කළ යුත්තක් විය. එයට හේතුව එකල දෙවියන් පිළිබද විශ්වාසය මුණි ගුණ අභිබවා මිනිසුන් පිළිගත් නිසා ය. මිනිසුන් තුළ ඇති අසීමිත දේව විශ්වාස

කඩා බිඳ දැමීම මෙම ග්‍රන්ථයෙහි තවත් පරමාර්ථයකි. බුදුගුණවර්ණනා කිරීමට මෙම ග්‍රන්ථය කළ බව ග්‍රන්ථයට යොදා ඇති නමින් ම පෙන්නුම් කෙරෙයි. අතීතයෙහි වැඩ සිටි සංඝ පීතෘන් වහන්සේලාගේ උත්තරීතර ගුණ ධර්ම හුවා දැක්වීම ද මෙහි තවත් අදහසකි. එයට හේතුව භික්ෂු ජීවිතය යනු ඉතා දුකසේ පිළිපැදිය යුතු කටුක එකක් බව පෙන්වා දීමයි. ඒ සඳහා උන්වහන්සේ සැරියුත් මුගලන් දැගසව්වන් දෙනමගේ ජීවිත කථාව ද මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේද ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමියන්ගේ චරිතකථා ද මෙහි ඇතුළත්කර තිබෙයි. මෙහි පාලිගාථා එකසිය තිස්පහක් දකින්නට ලැබෙයි. බුදුගොස් හිමි සහ ලාංකික භික්ෂූන් දිවි දෙවෙනි කොට ධූතාංග ආරක්ෂා කළ ආකාරය තත්කාලීන භික්ෂූන්ගේ දැනගැනීම සඳහා මෙය රචනා කර ඇත. මුනිගුණ අලංකාරය උන්වහන්සේගේ කුලුදුල් ග්‍රන්ථය වුව ද පාලි භාෂාව හැසිර වීමේදී දක්වා ඇති විශාරදත්වය මැනවින් පෙන්නුම් කෙරෙයි.

සාරාර්ථ සංග්‍රහය සංඝරාජ හිමියන්ගේ තවත් ශාස්ත්‍රීය කෘතියකි සහරජවත මෙම කෘතිය පිළිබඳ මෙසේ සඳහන් කරයි. පළමුවෙන් පිරිපුන් එකොළොස් දහසක් ධර්ම ග්‍රන්ථයන්ගෙන් ගැවසුණු සාරාර්ථ සංග්‍රහ නම් බණපොත රචනා කර ඇත්තේ ජාතක කථා, විසුද්ධිමග්ග, බුද්ධවංශ, සද්ධර්මරත්නාවලී දීඝනිකාය ආදී උසස් බණපොත් බලා කෙටිකරගත් තොරතුරු අනුවයි.[73] ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමාගේ කාලයේ එතුමාගේ ආරාධනාවෙන් සරණංකර හිමියන් විසින් කරන ලද බව සඳහන් වෙයි.[74] බුදුරජාණන් වහන්සේගේ නව අරහාදී බුදුගුණ වලින් එකක් වන සම්මා සම්බුද්ධ ගුණය වර්ණනා කිරීම සඳහා මෙම ග්‍රන්ථය ලියා ඇති බව පෙනෙයි. විශුද්ධිමාර්ගය මේ සඳහා මූලාශ්‍රකරගත් බව පෙනෙයි. මෙය බුදුදහමට කරන ලද කෝෂ ග්‍රන්ථයක් බඳු ය. මෙකල බොහෝ බෞද්ධයෝ බුදුරජාණන් වහන්සේට වඩා දෙවියන් පිළිබඳ බලවත් විශ්වාසයකින් කටයුතු කළහ. බුදුරාජාණන් වහන්සේ කෙබඳු උත්තමයෙක් ද යන වග ඔවුන් නොදැන සිටින්නට ඇත. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය සහ උත්තරීතරත්වය විදහා පෑමට මෙහි මුල්



පරිච්ඡේද යොදාගෙන තිබෙයි. එසේ ම මහාකාශ්‍යප මහරහතන් වහන්සේගේ චරිතය මුල්කරගෙන බුද්ධකාලයේ භික්ෂූන් වහන්සේලා අනුගමනය කළ පිණ්ඩපාතිකාංගය, පාංශුකූලිකාංගය වැනි උතුම් තෙළෙස් ධූතාඞ්ග ආරක්ෂා කරගැනීමේ අගය පහදා දීමට උන්වහන්සේ මෙහිදී උත්සාහ දරා තිබෙයි. එය එසේ කර ඇත්තේ මෙරට පිරිහී ගිය එවැනි අංග නැවත ඇතිකර ආරක්ෂා කරගැනීමේ අදහසින් ය.[75]

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීම සඳහා සහරජ හිමියෝ භාවිත කර ඇති ග්‍රන්ථ ප්‍රමාණය දෙස බලන විට උන්වහන්සේ තුළ තිබුණු බහුශ්‍රැත බව මනාව පැහැදිලි වෙයි. බෞද්ධ ග්‍රන්ථවලට අමතරව ෂඩ්දර්ශන ද මේ සඳහා උපයෝගී කරගෙන තිබෙයි. මෙය ඉතා සරල සිංහලයෙන් රචනා කර ඇති නමුත් සමහර තැන්වල දීර්ඝ රචනා ශෛලියක් දක්නට ලැබෙයි.

අභිසම්බෝධි අලංකාරය ද උන්වහන්සේ විසින් රචිත තවත් ග්‍රන්ථයකි. මෙය ද බුදුගුණ වැනීම සඳහා පාලිභාෂාවෙන් කරන ලද්දකි.[76]

භේසජ්ජමඤ්ජුසා සන්නය මෙය ද වීරපරාක්‍රම නරේන්ද්‍ර සිංහ රජතුමාගේ ආරාධනා වෙන් ලියා තිබෙයි. රජතුමාට වීදාගම මහාවිහාරයෙන් ලැබුණු භේසජ්ජමඤ්ජුසා නම් ග්‍රන්ථයට සන්නයක් සැපයීමට සරණංකර සාමණේරයන්ට භාරකළේය. එය උන්වහන්සේ ඉතාමත් අනර්ඝ ලෙසින් ශාස්ත්‍රීය පදනමකින් යුක්ත ව රචනා කළහ. උන්වහන්සේ මෙම භාරදූරකාරියය සඳහා තම උගත් ශිෂ්‍යයන්ගේ ද උපකාර ලැබ් ඇත.

රත්නත්‍රය ප්‍රණාම ගාථා සන්නය නම් කෘතිය ද උන්වහන්සේ විසින් රචිත තවත් ග්‍රන්ථයකි. ත්‍රිවිධරත්නය පිළිබඳව බැඳ ඇති එනම් රත්නත්‍රය ප්‍රණාම ගාථාවන් වලට මෙම සන්නය ලියා තිබෙයි. මෙම සන්නය ද ඉතාමත් ව්‍යක්ත අන්දමින් රචනාකර තිබෙයි. එක වචනයකට සන්න කීම් වශයෙන් දීර්ඝ විස්තර සහිත ව මෙම ග්‍රන්ථය ලියා තිබෙයි. සරණංකර හිමියන්ගේ තරුණකාලයේ දී ම ලියන ලද කෘතියක් ලෙසට මෙය පිළිගැනෙයි.

මහා බෝධිවංශ සන්නය ද ශ්‍රී විජය රාජසිංහ රජුගේ ආරාධනාවෙන් සරණංකර හිමියන් විසින් ලියන ලද්දකි. මෙය පාලියෙන් ලියවී තිබුණු මහා බෝධිවංශයට ලියන ලද පදගතාර්ථ සන්නයකි. සරණංකර හිමියන් මුල් ග්‍රන්ථවල සියලු ම නම් මෙහි සඳහන් කර තිබෙයි. මෙය ප්‍රමාණයෙන් ඉතා විශාල ග්‍රන්ථයකි. උත්තිය නම් තෙරුන් වහන්සේගේ පාලි බෝධි වංශයට ලියන ලද තවත් පරිවාර ග්‍රන්ථයකි මෙම මහාබෝධිවංශ සන්නය. මෙම කෘතියටද මධුරාර්ථ ප්‍රකාශිනී යනුවෙන් ද සඳහන් වී තිබේ.[77]

කීර්ති ශ්‍රී රාජසිංහ කථිකාවත ද සරණංකර හිමියන්ගේ මූලිකත්වයෙන් ම සිදුකරන ලද්දක් බව පෙනෙයි. මතු සසුනෙහි ප්‍රයෝජනය සඳහා මෙම උතුම් කථිකාවත සකස් කර තිබෙයි. මෙය ද අතීතයේ සිදුකළ දඹදෙණි කථිකාවත ආදර්ශයට ගෙන සිදුකරන ලද්දක් බව පෙනීයයි.[79]

ලක්දිව ඒ ඒ පලාත්වලින් භික්ෂූන් මහනුවරට ගෙන්වාගෙන[80] එසේ ම මල්වතු අස්ගිරි උභය විහාරයන්හි සංඝයා මල්වතු වෙහෙරට කැඳවා එහි උපෝසථාගාරයේදී අටුවා සහිත විනය පිටකය සංගායනා කළේ ය.[81] එසේම එම භික්ෂූන්ට විනයානුකූල අවවාද ආදිය ද ලබාදුන්හ. භික්ෂූන් ලවා පෙළ පොත් මෙන් ම අටුවා පොත් ද ටීකා පොත් ද ලියවමින් ශාසනාරක්ෂාව සඳහා කටයුතු කළහ.

මුල්කිරිගල සංඝ පරම්පරාවේ ප්‍රධානියා වන වටරක්ගොඩ ධම්මපාල සමිඳුන්ට සංඝරාජ හිමියන් විසින් ශාසනික ප්‍රතිපත්ති විස්තර කරමින් විශේෂ සන්දේශයක් යවා තිබේ. මෙම පිටපත නුවරඑළිය රාජ්‍ය ලේඛනාගාරයේ දකින්නට ඇත.[82] මෙය ඉතාමත් දීර්ඝ ලිපියකි. මෙහි එන පරිදි භික්ෂුවක් විසින් කියවා දැන ගත යුතු ග්‍රන්ථ රාශියකගේ නම් සඳහන්වෙයි. ඒ අතර බුරුම සියම් ආදී රටවලින් ගෙනෙන ලද කෘති වල නම් ද දක්නට ලැබේ. ඒ අනුව මෙය ද උන්වහන්සේ විසින් ලියවුණු ඉතා වටිනා ලියමනක් බව පෙනෙයි.

පාලි සන්දේශය මෙය සියමයෙන් උපසම්පදාව ගෙන්වා ගැනීම සඳහා ලියන ලද දීර්ඝ සන්දේශයකි. මෙම ලේඛනය ඉතාමත් ව්‍යක්ත පාලි භාෂාවෙන් රචනා කරන ලද්දකි. මෙය වීරපරාක්‍රමබාහු නරේන්ද්‍ර සිංහ රජතුමාට ලියන ලද්දකි. ලොව්තුරු



බුදු හිමියන්ගේ පිරිනිවීමේ සිට ලංකා ශාසන ඉතිහාසය මෙහි ඉතා සංක්ෂිප්තව දක්වා තිබෙයි. මෙය විදේශීය දූත ගමන සඳහා සකස් කරන ලද්දකි. දින වකවානු රජතුමාගේ නම පවා ඕනෑම අවස්ථාවක වෙනස් කරගත හැකි ආකාරයට හිඩැස් තබා රචනාකර තිබෙයි. මෙය ද ඉතා වටිනා ලිපියකි.

ලක්දිවට වැඩමකොට උපසම්පදාව පිහිට වූ උපාලි හිමි ඇතුලු පිරිසට ද ආපසු සියම් රටට වැඩමකර එම රජතුමාට පිළිගැන්වීමට වටිනා සන්දේශයක් සඟරජ හිමියන් විසින් රචනාකර තිබෙයි. මෙය ද ව්‍යක්ත පාලි භාෂාවෙන් ලියන ලද සන්දේශයකි. චීන රජතුමාටත් මෙහි වැඩම කළ සියලු හිමිවරුනටත් පින් අනුමෝදන් කිරීම සඳහා මෙය රචනා කර තිබෙයි.[83] එසේම මෙම සත් කාර්යය සඳහා ක්‍රියා කළ සැම දෙනාට ම චිරජීවනය ද මෙහි ප්‍රාර්ථනා කර තිබෙයි.

සතර බණවර සන්නය ද ශ්‍රී විජය රාජසිංහ රජතුමාගේ ආරාධනයෙන් සරණංකර සංඝරාජ හිමියන් විසින් සම්පාදනය කරන[84] ලද්දකි. මෙය සාරාර්ථදීපනී යන නමින් ද හඳුන්වයි.[84] සංක්ෂේපාර්ථ දීපනී නම් සතර බණවර සන්නය ද මෙම ග්‍රන්ථය ලිවීමේදී භාවිතයට ගෙන තිබෙයි. මෙම යුගයේ භික්ෂූන් වහන්සේ ඇතුලු බෞද්ධ ගිහි ජනතාව ද බලි බිලි තොවිල් යන්ත්‍ර මන්ත්‍ර වලට බෙහෙවින් හුරු වී සිටි අතර එය වලක්වා පිරිත් ධර්මයෙන් ලැබිය හැකි ශාන්තිය කෙරෙහි භික්ෂූන් වහනසේලා යොමු කිරීම මෙම ග්‍රන්ථය රචනා කිරීමෙ අරමුණයි.

රූපමාලාව ද සරණංකර සංඝරාජ හිමියන් විසින් රචිත තවත් වටිනා ග්‍රන්ථයකි. මෙය පාලි ව්‍යාකරණය සඳහා ලියන ලද්දකි. උන්වහන්සේගේ ශිෂ්‍යයන්ට පාලි භාෂාව ඉගැන්වීමේදී ඇතිවන ගැටලු සඳහා මෙය සම්පාදනය කර තිබෙයි. එම යුගයේ ශිෂ්‍යයන් අතර මෙය බෙහෙවින් ජනප්‍රිය වී තිබුණු ව්‍යාකරණ ග්‍රන්ථයකි. මෙය පාලි වරනැගිල්ල, ව්‍යාකරණ ආඛ්‍යාත ආදී සැම දෙයක්ම ඇතුලත් කර සම්පාදනය කර තිබේ.

18 වන සියවසේ අන්තයටම පිරිහී ගොස් තිබුණු සාහිත්‍ය සේවාව වර්තමානයේ මේ අයුරින් පවත්වා ගැනීමට හැකි වුයේ සරණංකර හිමියන්ගේ නොපසුබට උත්සාහය නිසා ම ය. එසේම අභාවයට ගිය ශාසනික ප්‍රතිපත්ති වලට ද පුනර්ජීවනය ලබා දුන්නේ ද මේ අද්විතීය චරිත ලක්ෂණ වලින් හෙබි වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජෝත්තමයෝම ය.


ආශ්‍රිත ග්‍රන්ථ

01. මහාවංශය. පරි: vii: ගාථා 44

02. මහාවංසය පරි: x : ගාථා : 21 - 23

i. පණ්ඩුලො බ්‍රාහ්මණෝ නාම

භොගවා වේද පාරගු

දක්ඛිණස්මිං දිසාභාගේ

වසී රාහුල ගාමකෙ.

ii සිප්පං උග්ගන්හ තාතාති

සිප්පුග්ගහ මකාරයි

චන්දේන තස්ස පුත්තේන

ඛිප්පං සිප්පං සමාපිතං.

03. මහාවංශය පරි: x ගාථා 97.

04. Rhys Devids මෙය පරිවර්තනය කර ඇත්තේ A hall for those recovering from sickness යනුවෙනි.

05. රාහුල හිමි වල්පොල :- විදුලකර ලිපි. 2504 පිට. 49. විද්‍යාලංකාර ප්‍රකාශන. - කැලණිය

06. Adikaram. E.W. Early History of Buddhism in Ceylon.

07. රාහුල හිමි වල්පොල:- විදුලකර ලිපි. 2504 පිට 56. විද්‍යාලංකාර ප්‍රකාශන.

08. දීඝනිකාය: සිඟාලක සූත්‍රය : බු:ජ:ත්‍රි: පිටුව: 288

09. රාහුල හිමි වල්පොල: ලක්දිව බුදුසමයේ ඉතිහාසය. 1966. ගුණසේන සහ සමාගම - කොළඹ.

10. මහාචාර්ය හෙන්රි වීරසිංහ: අධ්‍යාපන මූලධර්ම 1993 - ක්ලැන්සි ප්‍රකාශන - කොළඹ.





11. රාහුල හිමි වල්පොල:- ලක්දිව බුදුසමයේ ඉතිහාසය. 1966 ගුණසේන සහ සමාගම. කොළඹ.

12. මහාචාර්ය මංගල ඉලංගසිංහ:- 'දහම් අමා 2300 මිහිඳු ජයන්තිය පිටුව:- 38. 1992 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

13. විමති විනෝදනී විනය ටීකාව:

'පරිවේණන්ති තස්ස විහාරස්ස අබ්භන්තරෙ විසුං විසුං පාකාරාදී පරිච්ඡින්නට්ඨානං පරිවේවසේන වේදියති දස්සේති පරිවේණං.'

14. පඤ්ඤකිත්ති හිමි කොටහේනේ:- ආගම හා සමාජය 1946. විදුලකර ප්‍රකාශන කැලණිය.

15. විමති විනෝදනී විනය ටීකාව.

'භික්ඛු ධම්මං පරිවේණන්ති ජානන්ති බින්නෙන්ති තිසා මෙන්ති...

Education in Ceylon - A Centenary Volume 100. - 1969.

16. මහාචාර්ය හෙන්රි වීරසිංහ:- අධ්‍යාපන මූලධර්ම. 1993 ක්ලැන්සි ප්‍රකාශන - කොළඹ.

17. මහාචාර්ය මංගල ඉලංගසිංහ:- දහම් අමා 2300 මිහිඳු ජයන්තිය. පිටුව 44. 1992. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

18. ජයතිලක ඩී.බී. කතිකාවත් හා සහරා. 1955 ගුණසේන සහ සමාගම, කොළඹ.

19. සීලක්ඛන්ධ හිමි තුඹුල්ලේ:- අස්ගිරි මහා විහාරයේ ප්‍රභවය විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය

1997. පරි: 07 පිටු. 216 - 265. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

20. වික්‍රමසිංහ කේ. ඩී. පී. :- කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍ය 1965. ගුණසේන සහ සමාගම. කොළඹ.

21. රංජිත් රුබේරු:- ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය. 1971

ඇපෝතකරීස් - කොළඹ.

22. ප්‍රඥාරාම නාහිමි යක්කඩුවේ: අපේ ගමන් මග. විද්‍යාලංකාර ප්‍රකාශන.

23. සීලක්ඛන්ධ හිමි තුඹුල්ලේ :- අස්ගිරි මහා විහාරයේ ප්‍රභවය විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. පරි.07. පිටු: 218, 260. දක්වා. 1997. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

24. i. සංඝරාජ සාධු චරියාව:- පිටුව 02 හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ කොළඹ.

ii. සඟරජ වත - පිටුව 79 කවි 71-73 - 1955 සංස්කාරක:-ශ්‍රී චාලිස්ද සිල්වා. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම. කොළඹ.

25. සංඝරාජ සාදු චරියාව: පිටුව 02. 1985. හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ. කොළඹ.

26. සහරජ වත, පිටුව 80. කවි: 80.81.

i. යකුන් එලවන්නත් - වෙදකම් නැකත් දන්නත්
නැයින් රකින්නත් - පලක් නැත මට මුත් සෙව්මෙන්

ii. පිඩුසිහා යන්නත් - බුදුබණේ හැසිරෙන්නත්
හිරිඔතප් තිබෙන්නත් - ඉතා යෙහෙකැයි උන් සෙවීනත්

27. සහරජ වත ගොත: පිටුව 02:1963: තිරස්ණගම රතනසාර මහා සථවිර:සමන් ප්‍රකාශකයෝ මහරගම.

28. සහරජ වත ගොත: එම: පිටුව 02

29. සංඝරාජ සාධු චරියාව: පිටු. 15. හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ කොළඹ.

30. සහරජ වත ගොත: පිටුව 02. 1963. තිරාණගම රතනසාර ස්ථවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම.

31. එම. පිටුව 08.

32. සංඝරාජ සාධු චරියාව: පිටුව 05. හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්නපොත් ප්‍රකාශකයෝ - කොළඹ.

33. සංඝරාජ සාධු චරියාව: එම: 04 පිටුව

34. i. සහරජ වත ගොත: පිටුව 20. පද්‍යය 63. 1963 තිරාණගම රතනසාර ස්තවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම

ii. සංඝරාජ සාධු චරියාව පිටු. 17.21. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ - කොළඹ.

35. සංඝරාජ සාධු චරියාව: පිටුව 12. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ කොළඹ.

36. සංඝරාජ සාධු චරියාව: එම: පිටුව 14 පිටුව

37. සහරජ වත ගොත: පිටුව 06. 1963. තිරාණගම රතනසාර මහා ස්ථවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම.

38. එම. පිටුව 09 පිටුව.

39. සංඝරාජ සාධු චරියාව. එම. පිටුව 18. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර 1964 රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.



40. සහරජ වත ගොත: පිටුව 10. 1963. තිරාණගම රතනසාර මහා ස්ථවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම.

41. සරණංකර සංඝරාජ සමය. වාචිස්සර හිමි. කොටගම. 1964. දෙන් අඩ්වින් සහ සමාගම. කොළඹ.

42. සංඝරාජ සාධු චරියාව. පිටුව 10. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

43. සහරජ වත ගොත: පිටුව. 08. 1963. තිරාණගම රතනසාර ස්ථවිර සමන් ප්‍රකාශකයො. මහරගම.

44. සරණංකර සංඝරාජ සමය. වාචිස්සර හිමි. කොටගම. 1964. දෙන් ඇඩ්වින් සහ සමාගම. කොළඹ.

45. එම

46. සන්නස්ගල ජී. බී. සිංහල සාහිත්‍ය වංශය 1964 ලේක්හවුස් මුද්‍රණාලය. කොළඹ

47. ලංකානන්ද මහා ස්ථවිර ලබුගම. මන්දරම් පුවත. 1958 සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

49. සංඝරාජ සාධු චරියාව. පිටුව 20. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

50. කුසලක්‍රියානු සංදේශය

51. මල්වතු මහා විහාර රාජාවලිය. i

52. මල්වතු මහා විහාර රාජාවලිය. ii

53. සහරජ වතගොත: 1963. තිරාණගම රතනසාර මහා ස්ථවිර: සමන් ප්‍රකාශකයෝ. මහරගම පද්‍යය 181.

සරණංකර නමමැ සස්නෙහි පසිදු කර.

තපසුන් හට මහත් කර සහරජ ඉසුර.

54. Education in Ceylon : A Centenary Volume 100. 1969' Ministry of Education

55. ලංකානන්ද මහා ස්ථවිර ලබුගම. මන්දරම් පුවත. 1958. පද්‍යය 532. සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

56. සංඝරාජ සාධු චරියාව. පිටුව 10. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්නපොත් ප්‍රකාශකයෝ කොළඹ.

57. සහරජවතගොත : පද්‍යය 272. 1963. තිරාණගම රතනසාර මහා ස්ථවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම.

58. එම. පද්‍යය 271.

59. එම. පද්‍යය 267.

60. එම. පද්‍යය 269.

61. එම. පද්‍යය 270.

62. එම. පද්‍යය 266.

63. එම. පද්‍යය13.

64. ශ්‍රී පාද තඹ සන්නස

65. සහරජවත: පිටුව: 1995 (සං) ශ්‍රී චාලිස් ද සිල්වා. පිටුව 12. ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

66. සංඝරාජ සාධු චරියාව පිටුව. 37. 1969. (සං) හෙන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්න පොත් ප්‍රකාශකායෝ. කොළඹ.

67. එම පිටුව 32.

68. මහාචාර්ය වජිර හිමි කුඹුරුගමුවේ, දළදා ඉතිහාසය හා සංස්කෘතිය 1993 පළමු මුද්‍රණය.

69. සංඝරාජ සාධු චරියාව: පිටුව 32. 1969. (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්නපොත් ප්‍රකාශකයෝ කොළඹ.

70. සහරජවත ගොත: පිටුව 33. 963. තිරාණගම රතනසාර මහා ස්ථවිර. සමන් ප්‍රකාශකයෝ. මහරගම:

71. සරණංකර සංඝරාජ සමය. වාචිස්සර හිමි. කොටගම. පිටුව 236. 1964 දෙන් ඇඩ්වින් සහ සමාගම. කොළඹ.

72. සහරජවත. 42 පිටුව. 100 පද්‍යය. 1955. (සං) ශ්‍රී චාලිස් ද සිල්වා ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

යති ගණ මන රම්මේ සුනදරේ කාන නස්මිං
සුකත නියම කන්දවිහේ විහාරේ වසන්තො
සතපි අපර පඤ්චත්තිංස ගාථා යුපෙතෙ
සමුණි ගුණ අලංකාරාදිකො නූතනේත

73. එම 42 පිටුව. 1955. (සං) ශ්‍රී චාලිස් ද සිල්වා. ඇම්.ඩී. ගුණසේන සහ සමාගම කොළඹ.

සාර අත් සහරය - කියා මෙනමින් හවරය.
මතුකලක් මෙපුරය - කළා පවතින ලෙසට මෙපුරය.

74 සතර බණවර සන්නය - 17 පරිච්ඡේදය

75 සරණංකර සංඝරාජ සමය. එම. 240. පිටුව. වාචිස්සර හිමි කොටගම. 1964. දෙන් ඇඩ්වින් සහ සමාගම. කොළඹ.

76. සරණංකර සංඝරාජ සමය. එම. 237. පිටුව.



77. Dr. Godakubure Sinhalese Literature page 33 1955 Apothcurice Colombo

78. ජයතිලක ඩී.බී. කතිකාවත් සහරා. 1995 විද්‍යාලංකාර ප්‍රකාශන - කැලණිය

79. සරණංකර සංඝරාජ සමය. 189. පිටුව. වවාචිස්සර හිමි කොටගම. 1964. දෙන් ඇඩ්වින් සහ සමාගම. කොළඹ.

80. සංඝරාජ සාධු චරියාව පිටුව. 30, (සං) හේන්පිටගෙදර පියනන්ද ස්ථවිර. රත්නපොත් ප්‍රකාශකයෝ කොළඹ.

81. මල්වතු මහාවිහාර රාජාවළිය ii

82. සරණංකර සංඝරාජ සමය - 239. පිටුව. වාචිස්සර හිමි කොටගම. 1964. දෙන් ඇඩ්වින් සහ සමාගම. කොළඹ.

83. සරණංකර සංඝරාජ සමය. එම. 244. පිටුව.

84. එම. 241. පිටුව.

LIBRARY